# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2143/48 - 2019 ඔක්තෝබර් මස 03 වැනි බ්‍රහස්පතින්දා - 2019.10.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### (262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66ආ(2) වගන්තිය යටතේ කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ සභාපති ධුරයේ පුරප්පාඩුව පිරවීම

මියයාම හේතුකොට ගෙන කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ සභාපති ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66 ආ (2) වගන්තිය යටතේ තනතුර දැරූ සභාපති වන විරසූරිය මුදියන්සේලාගේ සංජීව ප්‍රියනාත් අයත් වන්නා වූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත සභාපති වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නාවූ ද, එම කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ සභාපති පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා විරසිංහ කංකානම්ගේ ආනන්ද වීරසිංහ නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි, තානන්තිරි විතානගේ පෝෂිතා කෞමදී වන මම, 2017 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය වූ) 66 ආ (2) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් වීරසිංහ කංකානම්ගේ ආනන්ද වීරසිංහ, කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ සභාපති වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ටී. ඩබ්ලිව්. පෝෂිතා කෞමදී,
තේරීම්භාර නිලධාරි,
කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 02 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
මාතර.

10 - 635/1

1A - G 31175 — 37 (2019/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**(262 අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66ආ(2) වගන්තිය යටතේ කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ උප සභාපති ධුරයේ පුරප්පාඩුව පිරවීම**

උප සභාපති, සභාපති ලෙස පත් වීම හේතුකොට ගෙන කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ උප සභාපති ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66 ආ (2) වන වගන්තිය යටතේ තනතුර දැරූ උප සභාපති වන වීරසිංහ කංකානම්ගේ ආනන්ද වීරසිංහ අයත් වන්නා වූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත උප සභාපති වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ උප සභාපති පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා ලලිත් අල්විස් සමරසිංහ නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි, තානන්තිරි විතානගේ පෝෂිතා කෞමදී වන මම, 2017 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය වූ) 66 ආ (2) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් ලලිත් අල්විස් සමරසිංහ, කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ උප සභාපති වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ටී. ඩබ්ලිව්. පෝෂිතා කෞමදී,
තේරීම්භාර නිලධාරී,
කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 02 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
මාතර.

10 - 635/2

---

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

මියයාම හේතුකොට ගෙන කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66 අ (1)(අ) වගන්තිය යටතේ කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ අංක 1 - ගතාර කොට්ඨාසයට තේරී පත්වූ වීරසූරිය මුදියන්සේලාගේ සංජීව ප්‍රියනාත් අයත් වන්නා වූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නාවූ ද, එම කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ අංක 1 ගතාර කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා රෙජී නාමෙල් වෙල්ලප්පිලි නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි, තානන්තිරි විතානගේ පෝෂිතා කෞමදි වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66 අ (1)(අ) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් රෙජී නාමෙල් වෙල්ලප්පිලි, කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ, අංක 1 - ගතාර කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ටී. ඩබ්ලිව්. පෝෂිතා කෞමදී,
තේරීම්භාර නිලධාරී,
කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව.

2019 ඔක්තෝබර් මස 02 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
මාතර.

10 - 635/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.